## <u>ජාතික ගමනාගමන කොමිෂන් සභාව</u>

**<u>මගී සේවා අවසර පත්‍ර හිමිකරුවන් වෙත කරනු ලබන දැනුම් දීමයි.</u>**

කොවිඩ් 19 වසංගතය යලි ව්‍යාප්ත වීම හේතුවෙන් ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත මගී සේවා අවසර පත්‍ර හිමියන්ගේ පැමිණීම තාවකාලිකව අත්හිටුවා ඇත.

අවසර පත්‍රයට අදාල පහත තොරතුරු **070 4361101** අංකයට Whatsapp කිරීම මගින් ඔබගේ අවසර පත්‍රය යාවත්කාලීන කර ගැනීමට හැකියාව ඇත.

1) අවසරපත්‍ර හිමිකරුගේ තොරතුරු ඇතුලත්ව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය. ( පහතින් දක්වා ඇත.)
2) අවසර පත්‍රය යටතේ ධාවනය වන බස් රථයට අදාලව ඉදිරි වර්ෂය සඳහා වලංගු ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත නිකුත් කරන ලද අසීමිත රක්ෂණය
3) ධාවනයට අදාල බස් රථයේ ඉදිරි වර්ෂය සඳහා වලංගු යෝග්‍යතා සහතිකය
4) ධාවනයට අදාල බස් රථයේ ඉදිරි වර්ෂය සඳහා වලංගු ආදායම් බලපත්‍රය හෝ දුම් සහතිකය
5) අවසර පත්‍ර පොතෙහි පිටු අංක 01 හා 02 හි පිටපතක් හා වින්ඩ්ස්ක්‍රීන් ලේබලයේ පිටපතක්
6) රියදුරුගේ සේවා කාලය සම්බන්ධ දිවුරුම් ප්‍රකාශයක් ( කොවිඩ් 19 වසංගතය හේතුවෙන් මෙම අවස්ථාවේදී දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කල නොහැකි නම් පහත කරුණු ඇතුලත් ලිපියක් )
   **1981 අංක 27 දරණ මෝටර් වාහන ( සංශෝධන ) පනතේ 169 වගන්තිය ප්‍රකාරව ඔබ විසින් බස් රථයේ ධාවනයේ නිරත කරවන රියදුරු මහතාගේ සේවා කාලය අඛණ්ඩව පැය 4.30 කින් පසුව පැය භාගයකට නොඅඩු විවේකයක් ලබා දෙන බවටත් , අදාල රියදුරු වෙත දවසේ පැය 24 ක කාල සීමාව තුලදී පැය 10 ක අඛණ්ඩ විවේක කාලයක් ලබාදීම සඳහා කටයුතු කරන බව සඳහන් විය යුතුය.**
7) ඉදිරිපත් කරන ලද තොරතුරු නිවැරදි හා සත්‍ය තොරතුරු බවටත්, එම තොරතුරු අදාල කර ගනිමින් අවසර පත්‍රය යාවත්කාලීන කර දෙන ලෙසට අවසර පත්‍ර හිමිකරුගේ ඉල්ලීමක් ( අවසර පත්‍ර හිමිකරුගේ නිවැරදි අත්සනින් )

ඔබ විසින් ඉදිරිපත් කරන තොරතුරු පරික්ෂා කිරීමෙන් අනතුරුව අවසර පත්‍රය යාවත්කාලීන කිරීම සඳහා ගෙවිය යුතු මුදලට අදාල ගෙවීම් වවුචරය ඔබ වෙත Whatsapp කිරීමට කටයුතු කරයි.ඉන් අනතුරුව එම මුදල මහජන බැංකුවේ නාරාහේන්පිට ශාඛාවේ **<u>119100133693155</u>** අංක දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා ජංගම ගිණුමට බැර කර ඊට අදාල රිසිට් පත නැවත **070 4361101** අංකයට ඔබ විසින් Whatsapp කල යුතුය.

**සභාපති,**
**ජාතික ගමනාගමන කොමිෂන් සභාව.**